සිංහල භාෂාව හා සාහිත්‍යය

වස්සානය

සාහිත්‍ය

විචාර අත්වැල

10 – 11 ශ්‍රේණි

නම - ....

පන්තිය - ....

පාසල - සාන්ත ඇලවීෂියස් විද්‍යාලය

සැකසුම. පූජ්‍ය නෙරළුවේ ලංකානන්ද හිමි.
සාන්ත ඇලවීෂියස් විද්‍යාලය - ගාල්ල.

01. වස්සානය පද්‍ය පන්තියේ රචකයා - රත්න ශ්‍රී විජේසිංහ
02. පද්‍ය පන්තිය උපුටාගත් පොත - වස්සානේ
03. මොහු අයත්වන සාහිත්‍ය යුගය - නූතන
04. මොහුගේ ප්‍රථම කාව්‍ය ග්‍රන්ථය - බිය නොවන් අයියණ්ඩි
05. රත්න ශ්‍රීවිජේසිංහ සූරීන්ගේ වෙනත් කාව්‍ය ග්‍රන්ථ- බිය නොවන් අයියණ්ඩි , වස්සානය,සල් ගහ යට, තරුණ ලකුණ මධ්‍යම යාමය
06. ගීත රචනා ග්‍රන්ථ - වංකගිරිය අරනෝ රාජ්‍ය සම්මාන සුදු නෙලුම රාජ්‍ය සම්මාන ගංගා ගීතය, ඉරබටු තරුව, නෙත නිලුපුල්, ආලක මන්දා
07. ළමා නිර්මාණ - සැලළිහිනියෝ, රන්කිරි කට, රතු කිකිළි, සින්දු කියන උණ පඳුර,
08. වෙනත් ලෙකන කටයුතු
ලස්සන ම අහස හා මතක සිතිවිලි, කටු ගහ යට, ලියවැල, අත්පසුර, සංවාද
09. මොහුගේ ජනප්‍රිය ගීත
සුදු නෙළුම කෝ සොරබොර වැවේ, කිරුළ මුතු ලිහී සර සර හඬින් වැගිරෙනා, අජානේය ඉස්කූටර්, ගංගාවක් වී ගලන්න, දෝත නළලත තබා හිටගෙන, මගේ දූවේ නුබ අවදියෙන් නම්, පුන් සඳ රෑට ඇවිදින්, බිම්බරක් සෙනග ගැවසුණු
10. රත්න ශ්‍රී සූරීන්ගේ පෞද්ගලික තොරතුරු
11. උපත 1953 ජූලි 2
12. ගම් ප්‍රදේශය ගාල්ල, නාකියාදෙණිය, තෙල්ලඹුර
13. ඉගෙනුම ලද විද්‍යායතන
නාවල රජයේ කනිටු පාසල, ඉහළ තෙල්ලඹුරේ දුටුගැමුණු පාසැල ,හික්කඩුවේ ශ්‍රී සුමංගල මධ්‍ය මහා විද්‍යාලය, ගාල්ල රිච්මන් විද්‍යාලය
14. රැකියා පිළිබඳ තොරතුරු
ගාල්ල නැමුංගෙල විදුහල, මොනරාගල හුලන්දාව විදුහල, සහ ගාල්ල ඇලෝසියස් විදුහල ආදි විද්‍යාලවල උප ගුරු, දකුණු පළාත් අධ්‍යාපන කාර්යාලයේ සිංහල භාෂා ඒකක භාර නිලධාරී, උණවටුන ගුරු විදුහලේ සිංහල විෂය කථිකාචාර්ය, සමෘද්ධි අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්.

වස්සානය

වර්ෂා යනු සංස්කෘත පදයයි. සිංහල අරුත වස්සානයයි. මෙහි ධ්නිතාර්ථයක්ද ගැබ් වෙයි. ගස් කොලන් නව පනක් ගන්වමින් ඇළ දොළ පිටාර ගලමින් පවතින වැසි සහිත දීර්ග කාල පරාසයක් සිහි කැදවයි. ඊසාන වැස්ස මොනරාගල ප්‍රදේශය වැනි වියලි කාලාප වලට විශේෂ වේ. ප්‍රථම පත්වීමත් රැගෙන හුලන්දාව පාසල වෙත යන කවියා බිරිද හා දරුවන් ගමෙහි තනිකර යෑමේ දුකත් කාන්සියත් තනිකමත් පරිසරයේ කටුකත්වයත් මෙමගින් නිරූපනය කරීමට උස්සාහ කරයි.

01 ඔය දැල දොඩමළුය දොඩමලුය, සුවඳ බැරුවා ඉන්ට
 නිල් වතුර තුරුලු කර කෙසේ අතහැර යම්ද
 කෙකටියා පඳුර සුදු මල් පොකුර වඩාගෙන
 සොඳුර නුඹ වාගේම හිනැහේය මා එක්ක

ඔය - ඇතින් ඇතට ගලා බස්නා ලොකු දිය පාර
දැල - දෙපැත්ත / ඉවුරු දෙක / දෙපස
දොඩමළු ය - කතා බහක යෙදීයි
නිල් වතුර - පිරිසිදු දිය ජලය
කෙකටියා -
වඩා ගෙන - පපුවට තුරුලු කරගෙන
සොඳුර - බිරිඳ / පෙම්වතිය / සුන්දරිය

හුලන්දා ඔය වැසි ජලයෙන් පිරී ගොසිනි. ජල පහර වේගවත්ය. ඉවුරුවල ජල පහර වදින හඬ නොකඩවා ඇසේයි. දැල හෙවත් ඉවුරු තල දොඩමලුය යනුවෙන් කවියා එය පවසි. වෙනදා මෙන් නොව ඔය පිරී දිය ගලා යයි. දැල එකතු වී දොඩමලු වනබව ව්‍යංගාර්ථයෙන් පෙන්වයි. රළ පහර නැග දෙවුරුවල වදින හඬ නො කඩවා ඇසෙන බව කවියා පවයි. එනම් ඔය පිරී ඇති බව ගම්‍ය කරයි. වැසි සමයේදී මහපොළොව තෙත් වී පණ ගසා තණ පඳුර තුරුලතා දිය කඳුරු(දිය උල්පත්) ලියලා වැඩෙයි. දිය හා ගොඩ මලින් පිරුණු පරිසරය සුගන්ධවත්ය. නිල් වතුර යන්න පිරිසිදු සිසිල් දිය සඳහා යෙදෙයි. ඔය නිල්පැහැති ජලය තුරුළු කරගෙන ඇති බව පවසයි. දෙවුරු වලින් මැදි කරගෙන හෙවත් තුරුළු කරගෙන ඇති බැවින් මෙය කදිම යෙදුමකි.ආදරය ස්නේහය ඇති කරන යෙදුමක් ලෙස පෙනෙයි. මෙවැනි යෙදුම් ගලන දියේ සුන්දරත්වය පාඨක සිත එහිම රඳවාල යි. ගලන ජලයෙ ජලජ ශාක ඇති නොවේ. එහෙත් කෙකටියා පඳුර මල් පිපී ඇති බව කවියා පවසයි. එහෙත් පිපී ඇති කෙකටියා මල් උත්ප්‍රේක්ෂාලංකාරයෙන් වර්ණනා කරයි. උත්ප්‍රෙක්ෂා ලංකාරය යනු

ස්වාභාවිකව පවතින යමක් වෙනත් ආකාරයකින් සිදුවෙතැයි පැවසීමයි. වඩාගෙන, යන්න ස්නේහයෙන් ඥාතීත්වයෙන් කැටිකොට යෙදූ යෙදුමකි. මල් පොකුරු වඩාගෙන යනු ජන බස් වහරයි. සොඳුර යනු ඔයයි. සුළං හුලංදා ඔය ලේඛකයා සමග මුලින් සිනාසී ඇත. නුඹ වාගේම කෙකටියා පඳුර සිනාසෙන බව පැවසීමෙන් එය පැහැදිලි වෙයි. සුවඳ බැරුවා ඉන්ට යනුවෙන් කවි වසත් ජන බසත් අවශ්‍ය පරිදි ගලපා ඇත. එළිසමය රහිත සිව්පද ආකෘතිය භාවිත කර ඇති බව පෙනේයි.

02. කුඹුක් අතු වතුර අතගගා නැමිලා දියට
    දිය කෙළින හැටි පුංචි මාළුවෝ දුටුවා ද
    පුර පසේ සඳ එක්ක තරගයට මොරන්ට
    හුලන්දා ඔය කිම් ද මල්වරව ඉල් මහට

කුඹුක් - ගංගා ඇළ, දොළ ආශ්‍රිතව විශාලව වැඩෙන ගස් වර්ගයකි
පුර පසේ සඳ - අමාවක පෝයට පසුව පසළොස්වක පෝය දින දක්වා ක්‍රමයෙන් විශාල . වෙමින් වැඩෙන සඳ
හුලන්දා - කුඹුක්කන් ඔයේ ශාඛාවකි, මොනරාගල දිස්ත්‍රික්කය හරහා ගලා බසී
මල්වර ව- වැඩිවියට පත්වී / වයසින් වැඩී මෝරා ගොස් / (වතුරෙන් පිරි)
ඉල් මහ - නොවැම්බර් මාසය සිංහල මාස ක්‍රමයට අනුව මේ මාසේ හඳුන්වේ.

ඔයෙහි ජලය පිරී ඇත. ඉවුරු තලවල ඇති කුඹුක් ගස්වල අතු අවට වසා ගෙන ඇත. ඔය දෙසට නැමී ගත් අතු ජලය ස්පර්ශ වෙයි. කවියා එය දකින්නේ උත්ප්‍රේක්ෂාලංකාරයෙනි. එනම් අතු ජලයේ ගැටෙනවා නොව අතු දියට නැමී දීය අතගගා පිරිමදිනවා යනුවෙන් කවියා පවසයි. මෙය අප්‍රාණික කුඹුක් අතු ද තමන් පරිද්දෙන්ම ජල ක්‍රීඩා කරන අයුරු පුංචි මාළුවනේ නුඹ දුටුවෙහි ද යන්න සරලව ගත හැකිය. පුර පක්ෂයෙහි සඳ දිනෙන් දින මෝරා වැඩෙයි. ඔය ද දිනෙන් දින වතුර පිරිමින් විශාල වෙමින් ගලා බසියි. සඳ හා ඔයත් තරගයක් නම් එය සජීවී බස් වහරකි. එමෙන්ම උත්ප්‍රේක්ෂාලංකාරයකි. මොණරාගලත් හුලන්දාවත් අතර හුලංදා ඔය පිහිටා ඇත. එය අන්තර් මෝසමේ දී ඔක්තෝම්බර් මාසයේ දී (වප් මාසය) වර්ෂාවත් සමග ඇති වේයි. දෙසැම්බර් මාසයේ දී තද වැසි ලබා ජල මට්ටම ඉහළ යයි. එහෙත් කවියා පවසනුයේ නොවැම්බර් මාසය හෙවත් ඉල් මාසයේ දී ළමා වියෙන් තරුණ වියට පත්ව ඇති බවයි (ජලය පිරී ඇති බවයි). එය මල්වරව ඉල් මහට යන්නේ පැහැදිලි වෙයි. ගංගාව ස්ත්‍රීත්වයට යොමු කොට භාවිත කිරීම කවියන්ගේ ලක්ෂණයකි. එබැවින් මෙය ගැලපෙන යෙදුමකි.

03. සෙනේහය පිරී ගිය ඔබෙ නයන නිල් පොකුණ
දිය නිලන වැසි සමේ රැළි නගා උතුරාය
තඹර පෙති අතර හෙල්මැලි රේණු වැසි වසින
ඔබෙ සිනාවෙන් නිවේ හුණුව ගිය ලේ නහර

නයන - ඇස / නුවන
දිය නිලන - නිල් දිය / පිරිසිදු වතුර
තඹර - නෙළුම්, අරවින්ද, පියුම්, කමල, දහස් පත, සහස්පත, සර, සරෝජ,
හෙල්මැලි - සුදු මානෙල්, සුදු උපුල්
රේණු - මලක මැද ඇති පරාග,මල් රොන්
හුණුව - රත් වූ, උණුසුම් වූ
නහර - හෘදවස්තුවට හා ඉන් පිටතට රුධිරය ගෙන යන නාල ධමනි හා ශිරා

මෙහි ඔබ යනු වස්සානයයි. නයන නිල් පොකුණ යන යෙදුමේ නිල් යනු පිරිසිදු දියත් ඇසෙහි නිලත් හඟවයි. වස්සානය ඇසක් බවටත් නිල්දිය පිරි පොකුණක් බවටත් නයන නිල් පොකුණ යන්න ගත හැකිය. මිනිසා හෙලන බැල්මෙන්ම ස්නේහය හෙවත් සෙනෙහස පුදා සජීවී කරණයට ලක් කරයි. දිය නිලන යනු පිරිසිදු වතුර එතැන මෙතැන ගලන, රොක්වී පවතින යන්නයි. රැළි නගා උතුරා යනු කෙසඟව ඉඩෝරයේ ගලා ගිය ඔය දිය පිරී ගලා යන ස්වරූපයත් රැළි නගමින් පවතින බවත්ය. තඹර යනු නෙලුමට හෙවත් අරවින්දයට නමකි. එනම් මෙහි එන්නේ පොකුණකි. මල් පෙති රේණු මකරන්ද හා සුගන්ධවත් බවින් යුතු පරිසරයකි. හෙල්මැලි, ඕලු, සුදු නෙළුම් වලට යෙදෙන නමකි. රේණු වැසි වසින යනු මල් සමූහයෙන් යුක්ත යන්න ව්‍යංගයෙන් පැවසීමකි. දැන් කවියා දන්නේ ඔහු ඉදිරියේ පොකුණක් තිබෙන බව නොව පොකුණ තමා හා මදහස නංවන බවකි. පැවැති නියං උණුසුම නිවී සිහිල්ව ගොස් ඇත. කය පුරා විසිරී ගොස් සකල ලේ නහර ඇතුළු මුළු සිරුරම සිසිල්ව ගොස් ඇති බව පවසයි.

04. දෙවැට දිග කරඳ වැල් ආරුක්කු යට සැඟව
නිල් කුරුලු බිලිඳු නිදි ඇහැරවන්නේ කුමට
රැගෙන දෝතට පෙරා උණුහුමට හිරු එළිය
මිහිරි මව්කිරි වගේ පොවන්නෙමි නුඹලාට

දෙවැට - වැටවල් දෙකක් අතර ඇති මීටරයක් තරම් පළල සහිත පටු අඩිපාර
කරඳ වැල් - කරඳ නැමැති ගස්වල පහතට නැමී පහත් වූ කුඩා අතු
ආරුක්කු - උඩ කොටස අර්ධ කවාකාර වූ දොරටු, මේවා බිත්තියක හෝ කණු දෙකක් අතර හෝ සිටුවන ලද ලී දෙකක් සම්බන්ධ කර හෝ සාදා ගනී Arch

නිල් කුරුලු බිලිඳු - නිල් කුරුල්ලා නැමති දුර්ලභ කුරුලු විශේෂයට අයත් කුරුලු පැටවා

හුලංදා ඔයෙන් පොකුණක් වෙත එළඹි කවියා දෙවටක් වෙතට පාඨකයා කැඳවයි. මගුල් කරද ගස් මග දෙපස වැවී ඇත. එහි නොමේරූ අතු අලුත් දලු ලා දිගට වැවී මග දෙපසින් පොළොව බලා පහත් වී ඇත. එය ආරුක්කු ලෙස යයි කීම චමත්කාරජනකය. චිත්‍රරූපී ජනකය. එහි නිල් කුරුලු පැටවු සීතලටත් විවේකයටත් කරද අත්තක දැස් පියාගෙන නිදයි. කවියා නින්දට බාධා වේ යැයි බියෙන් සෙමින් ගමන් කරයි. හිරු රැස් උණුසුම් වැඩිය.ශරීරයට වැටුනොත් ඔවුන් ඇහැර්වි යයි සිතා ගස් අතරෙන් වැටෙන හිරු එළිය පේරා දෝතට රැගෙන පැටවුන්ට ලබා දෙයි. මව්කිරි ළදරුවන්ට ඉතා මිහිරිය. ඒ වගේම පෝෂණීය ද වෙයි. හිරුරැස් ද ශරීරයට අත්‍යවශ්‍ය වෙයි. එබැවින් පෙරා දොතට රැගෙන පොවයි. ආරුක්කු යන රූපකයක් මව්කිරි වගේ උපමාවක් කවියා භාවිතා කරයි. ජීව පරිසරයට කවියා දක්වන ආදරය, ස්නේහය මෙමැනි වදන් තුල්න් ගමය වේ.

05. රමණීය වන ගැබෙහි මොනරුන්ට පිල් වියන
සන්නාලියන් කොහොම ඇන්දාද දේදුන්න
වැහි වතුර ඉහිනවා නම් ඔවුන් විහිළුවට
කුරුල්ලෝ ඉගිල්ලී වරෙන් නුඹ මා ළඟට

මොණරුනට පිල් - මොනරුන්ගෙ පියාපත්, පිහාටු

සන්නාලියන් - ඇඳුම් මසන්නන්

වස්සානයෙන් පිපී ගත් වන ගැබට පිවිසෙන කවියා එහි සුන්දරත්වය දකී.අලුතෙන් පියාපත් වැඩෙන මයුරයන් දකි. පියාපත් වැඩුණු පසු කෙතරම් සුන්දරද යන්න කවියා සිතයි. වරණවත් ද මෝස්තර සම්පන්න ද, දිග ද යන්න මෙනෙහි වේ. එය සන්නාලියන්ගේ ක්‍රියාවක් ලෙස කවියා සිතයි. එමෙන්ම සන්නාලියන් විසින් කෙසේ දේදුන්න අඳින ලද ද යන්න කවියා විමසයි. මොනරුන්ට පිල් වියීමත් දේදුන්න තැනීමත් සන්නාලි යන්ගේ ක්‍රියාවකි. ඒ දෙක එකට ගැළපීමට කවියා උත්සාහ දරයි. මොනර පිල් කළඹත් දේදුන්නත් අඩ කවාකාර වෙයි. එමෙන්ම අලංකාර ද වෙයි. එබැවින් උචිත ගැලපීමක් ලෙස පෙනෙයි. මෙහි සන්නාලිය නම් ස්වභාව සෞදර්යයි. ස්වභාව සෞදර්යට සජීවී බවක් ආරෝපණය කිරීමට යෙදී ඇති බව සන්නාලියන් කොහොම මැව්වා ද දේදුන්න යන්නෙන් ගම්‍ය කරයි. දේදුන්න අහසේ රැඳෙන්නේ සිහින් පොදින් ආකාසය තෙමෙද්දි ය. එබඳු හිරිපොද ට තෙමෙන්නට මලිති,බට්ති, කවුඩු, කොන්ඩ වැනි කුඩා කුරුල්ලො බෙහෙවින් ප්‍රිය කරති. කවියා එය දකින්නේ

වෙනත් ආකාරයකටය. දේදුන්න හා ආකාශය කුරුල්ලන්ට වැසි වතුර ඉසිමින් බාධා හිරිහැර කරන්නේ නම් ඔබට සුරක්ෂාව මා වෙත ඇති බව කුරුල්ලෝ ඉගිල්ලී වරෙන් නුඹ මා වෙතට යන ආදර වදනින් පෙනෙයි. ජීව අජීව පරිසරයටම අදරය පාන්නට කවියා සමත් වෙයි. චිත්තරූප මැවෙන සංකල්ප රූප දෘෂ්‍යමාන වෙයි.

06. වැසි වළාකුලු රංචු කඳු මුදුන් වල ලගින
දැන් ඒවි තැනි බිමට සීතලයි මගෙ සිතට
වැසි සමේ රෑ ඇඳේ සිහිනයක් වී ඉන්න
ඔබ එන්න ඉතින් මගෙ හෙට දවස මට දෙන්න

ලගින - නැවතී සිටින, ලැගුම් ගෙන සිටින
තැනි බිම්ට - තැනිතලා බිම් පෙදෙසට

මොනරාගල සිටින්නාට ඇත කඳු වළල්ල දුරට පෙනෙයි. එය වැහි වළාකුළුවලින් ගැවසී ගොසිනි. මෙහි එන රංචු හා ලගින යන වචන දෙකෙන් අජීවී වස්තු සජීවීකරණ ලක් කරනවා සේම උත්‍ප්‍රේක්ෂාලංකාරයෙන් විස්තර කිරීම ද යෙදෙයි. කන්දෙන් බැස වැසි වළාකුළු පැමිණියේ යැයි කවියා සිතයි. එසේ සිතත්ම එහි සිසිලස කවියාට දැනේයි. දැන් ඒ වැස්ස සජීවීකරණයක් කර රාත්‍රී සිහින දකිමින් ඉන්න වැස්සට පැමිනෙන්න යැයි ආරාධනා කරයි. සිහිනයෙන් දකින හෙට දවස ඔහු අපේක්ෂා කරයි. බිරිද හා දරුවනුත් සමග සිටින හෙට දවස ඔහු අපේක්ෂා කළා විය හැකිය.

07. ගිම්හානයේ ගිලන් වී කෘශව සුදුමැලිව
ඇදි ඇදී ඉකි ගැසූ ගඟ නැවත පිරිපුන්ය
දුෂ්කරය කියා හැර යා යුතු ද ජීවිතය
කටු පොකුර සිප ගනිමි හෙට මලක් වනු පිණිස

ගිම්හානයේ - ග්‍රීස්ම සෘතුවේදී / තදින් උෂ්ණුසුම දැනෙන වියළි කාලයේ දී

ගිලන් වී - රෝගී වී, අසනීප වී

කෘශව - කෙට්ටු වූ, කෙසඟ වූ

ඉකි ගැසූ - දුකින් ශෝකෙන් අඬන කළ හුස්ම අල්ලද්දි ඇඬුමේ දී ඇතිවන ගැස්ම ඉකි නමින් සැලකේ
.

ග්‍රීස්ම සමයේදී ගඟ සිඳී ගියේය. ඉතිරි වූයේ කුඩා දිය පහරකි. කෙඳිරිගාමින් අපහසුවෙන් යාන්තමින් ගලන ගඟ වියපත් රුවක් පාඨකයා ඉදිරියේ මවාපායි. වස්සානය ලැබීමත් සමඟ ගඟ නැවත පිරිපුන් වී ඇත. පිරිපුන් යන යෙදුමෙන් සජීවි බවක් ගංගාවට ලබාදෙයි.සජීවී බව ලබා දීමට රූපකාර්ථ භාවිතවට කවියා සමත්ව ඇත. වස්සානය එලබීමත් සමග මරණය පෙනි පෙනී සිටී ගග නැවත පිරිපුන් වීය.

දුෂ්කරයි කියා හැර යා යුතුද ජීවිතය,

කටු පොකුර සිප ගනිමි හෙට මලක් වනු පිණිස

පද්‍ය පන්තියේම කවියාගේ උදාන වාක්‍යය මෙයයි. කවර තරම් දුක්ඛ දෝමනස්සයන්ගේන් ජීවිතය පිරී ගිය ද ඉන් කලකිරී ජීවිතය අත් නොහළ යුතුය.එයට ශක්තිමත්ව මුහුණ දිය යුතුය. මතු දවසක ඒ දුක් දොම්නස් සොම්නස් බවට පෙරළෙයි. හෙට මලක් අපේක්ෂාවෙන් කටු පොකුරු සිප ගැනීමට කවියා සූදානම්ය. අද වේදනාව හෙට සැනසීමට ඉවහල් වන බව කවියා ව්‍යංගයෙන් පවසයි. මෙහි ඇති ඇඳි ඇදී ඉකිගැසූ ගඟ නැවත පිරිපුන්ය වැනි රූපකාර්ථවත් බස කදිමට ගැලපීමට කවියා සමත් වී ඇත.

සැ.යු - සාහිතය පොතෙහි විචාරාත්මක අවසාන පාඩම මෙය වේ.

ඔබට ගැලපෙන ලෙසත් ප්‍රමානාත්මකව මෙය විස්තර කර ඇත.

මෙයට අදාළ විඩියෝවක් හෝ හඬ පටයක් ලබා දීමට අපේක්ෂා කරමු.

මෙය අධ්‍යනය කර පාඩම තේරුන් ගැනීමට උත්සාහ කරන්න.

මෙය සටහන් පොතේ ලිවීමට අවශ්‍ය නොවූවත් සටහනක් ලෙස තබා ගැනීටම කටයුතු කරන්න.

නොතේරෙන තැනක් ඇත්නම් සිංහල ගුරුභවතුන්ගෙන් විමසා දැන ගන්න.